04 ඒකකය - සාධක හා ගුණාකාර(5)

➢ කුඩා ම පොදු ගුණාකාරය (කු.පො.ගු.)

සංඛ්‍යා කිහිපයක කුඩා ම පොදු ගුණාකාරය (කු.පො.ගු.) යනු එම එක් එක් සංඛ්‍යාවෙන් ඉතිරි නැතිව බෙදෙන කුඩා ම ධන සංඛ්‍යාව යි.

2හි ගුණාකාර	2, 4, 6, 8, 10, 12, 14, 16, 18, 20, 22, 24, 26
3හි ගුණාකාර	3, 6, 9, 12, 15, 18, 21, 24
4හි ගුණාකාර	4, 8, 12, 16, 20, 24, 28

2, 3 සහ 4 යන සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය = 12.

එනම්, 2න්, 3න් සහ 4න් බෙදෙන කුඩාම සංඛ්‍යාව එම සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය වේ.

නිදසුන

8, 6, 16 යන සංඛ්‍යාවල කු.පො.ගු. සොයන්න.

I ක්‍රමය

8, 6, 16 යන සංඛ්‍යා ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියමු.

$8 = 2 \times 2 \times 2 = 2^3$

$6 = 2 \times 3 = 2^1 \times 3^1$

$16 = 2 \times 2 \times 2 \times 2 = 2^4$

ඉහත සංඛ්‍යාවල එකිනෙකට වෙනස් ප්‍රථමක සාධක 2 සහ 3 වේ.

මෙහි 2 යෙදී ඇති වැඩිතම වාර ගණන 4කි.

3 යෙදී ඇති වැඩිතම වාර ගණන 1කි.

8, 6 සහ 16හි කු.පො.ගු. $= 2^4 \times 3$

$= 2 \times 2 \times 2 \times 2 \times 3$

$= 48$

II ක්‍රමය

2	8,	6,	16
2	4,	3,	8
2	2,	3,	4
	1,	3,	2

1, 3, 2 යන සංඛ්‍යා තුනෙන් අඩු ම තරමේ සංඛ්‍යා දෙකක් වත් බෙදෙන වෙනත් සංඛ්‍යාවක් නැති බැවින් බෙදීම නතර කරමු.

8, 6 සහ 16හි කු.පො.ගු.

$= 2 \times 2 \times 2 \times 1 \times 3 \times 2$

$= 48$

➢ ඔබේ ගණිතය පෙළ පොතෙහි ඇති 4.7 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.